# විසි එක්වන සියවසේ අධ්‍යාපනය

## Education in the 21st Century

කළුබෝවිටියන සෝරත හිමි

**Abstract**

A person as well as a society must have an accumulation of willful and determined goals for progress, otherwise there will be an unoriented wandering, then the saying "we are going but we are on the way " is reminded. As Education was imported from Europe, those educational systems eroded the unique qualities of the nation. The formation of unfit people who are strangers to any living society through an educational system it is a crisis phenomenon. 1500 years later, the education that was passed along with colonialism was called Western model education. Before that, almost every society existed in the education that was suitable for the existence of those societies. The education suitable for the citizenship of the ancient Athens city-state is presented in the book Plato's Republic. The city of Athens was an educational society. The historian Park mentions the city of Athens as a very good teacher. As later in the history of education, Japan's education was modernized in the 1870s. Their goal was to promote traditional knowledge and western industrial skills. After the Russian October revolution 1917, their general goal of education was to produce a communist character or another man. The communist education that started in 1949 aimed to make everyone a worker and an intellectual. After the Cuban revolution, there was a consensus on education in the old simple societies where the process of building a new man through education in that country would begin. Most of the time it was an education dedicated to building a well-rounded

human being. To be a lively sector of general education, the entire community including teachers, students, parents should be aware of it. It is the duty of the teaching community to teach every subject with a vision of these common goals. The ultimate goal of education is to produce a social man with human qualities and multiple skills. Swami Vivekananda has stated that current education does not have specific goals. According to him, the sculptor knows what the statue is that he is milking and the sitter knows what his painting is. But the teacher does not know who the student he is teaching will be. Accordingly, an exploratory study is expected to be conducted on the role of education for the next few centuries.

**Keywords:-** Scope, Traditional Wisdom, Discretionary, The vision, Management

**සාරසංක්ෂේපය**

පුද්ගලයෙකුට මෙන්ම සමාජයකට ද ප්‍රගමනය සඳහා අභිමතාර්ථ, නිෂ්ඨා, අරමුණු සමුච්චයක් තිබිය යුතුවේ. එසේ නොවුවහොත් දිශාභිමුඛ නොවූ ඉබාගාතේ යාමක් සිදුවේ. එවිට “We don’t know where are going. but we are on our way” යන කියමන සිහිගැන්වේ. අධ්‍යාපනය රටකින් රටකට ආනයනය කළ හැකි භාණ්ඩයක් නොවේ. යටත්විජිත සමයේදි බොහෝ ආසියානු අප්‍රිකානු රටවල අධ්‍යාපනය යුරෝපයෙන් ආනයනය කරන ලද හෙයින් එම අධ්‍යාපන පද්ධති තුළින් ජාතියට අනන්‍ය වූ අක්මුල් සිඳී ගියහ. අධ්‍යාපන ක්‍රමයක් මඟින් කුමන හෝ ජීවත්වන සමාජයට ආගන්තුක වන නොගැළපෙන පුද්ගලයින් බිහිවීම අර්බුද සහගත සංසිද්ධියකි. වර්ෂ 1500 යෙන් පසු යටත් විජිතවාදය සමග සම්ප්‍රාප්ත වූ අධ්‍යාපනය හඳුන්වනු ලැබුවේ බටහිර ආකෘතික අධ්‍යාපනය වශයෙනි. ඊට පෙරාතුව සෑම සමාජයකම පාහේ පැවතියේ එම සමාජවල පැවැත්මට උචිත-අනුකූලවන අධ්‍යාපනයකැ’යි සැලකිය හැකිය. පැරණි ඇතැන්ස් පෞරව රාජ්‍යයේ පුරවැසි භාවයට උචිත අධ්‍යාපනය ප්ලේටෝ The Republic යන ග්‍රන්ථයෙන් ඉදිරිපත් කොට ඇත. ඇතැන්ස් පුරවරය අධ්‍යාපනික සමාජයක් විය. ප්ලූටාක් ඉතිහාසඥයා අතැන්ස් පුරවරය

ගැන සඳහන් කරන්නේ ඉතා හොඳ ගුරුවරයෙකු (City is the best teacher) ලෙසයි. පසුකාලීන අධ්‍යාපන ඉතිහාසයේ 1870 සමයේ ජපානයේ අධ්‍යාපනය නවීකරණය විය. ඔවුන්ගේ අරමුණ වූයේ සම්ප්‍රදායික ඥානය හා බටහිර කාර්මික කෞශල්‍ය දියුණුවයි. වර්ෂ 1917 රුසියානු ඔක්තෝබර් විප්ලවයෙන් පසු ඔවුන්ගේ අධ්‍යාපන පොදු අරමුණ වූයේ කොමියුනිට්ස් මිනිසෙකු හෙවත් නව මිනිසෙකු බිහි කිරීමයි. වර්ෂ 1949 න් ආරම්භ වූ කොමියුනිට්ස් චීනයේ අධ්‍යාපනයේ අරමුණ වූයේ සෑම කෙනෙකුම ශ්‍රමිකයෙකු හා බුද්ධිමතෙකු කිරීමයි. කියුබානු විප්ලවයෙන් පසු එරට අධ්‍යාපනය මගින් නව මිනිසෙකු තැනීමේ ක්‍රියාමාර්ගය ආරම්භ කෙරිණි. පැරණි සරල සමාජවල අධ්‍යාපනය පිළිබඳ ඒකමතිකයක් තිබුණි. බොහෝ විට එය ගුණදහමින් යුත් හැදිච්ච මිනිසෙකු තැනීම සඳහා කැප වූ අධ්‍යාපනයක් විය. අධ්‍යාපනය පොදු අරමුණු සජීවී අංශයක් වීමට නම් ගුරු ශිෂ්‍ය දෙමාපිය ඇතුළු මුළු මහත් ප්‍රජාවම ඒ පිළිබඳව දැනුවත් විය යුතුය. එය ජාතික අධිෂ්ඨානයකින් යුතුව අධ්‍යාපන කළමනාකරණයේ සෑම අංශයක්ම තුළින් ප්‍රදර්ශනය විය යුතුය. සෑම විෂයක් ඉගැන්වීමේ දී මෙම පොදු අරමුණු පිළිබඳ දැක්මකින් - දර්ශනයකින් ඉගැන්වීම ගුරු ප්‍රජාවගේ යුතුකමකි. අධ්‍යාපන අභිමතාර්ථවල අග්‍රඵලය නම් මානුෂික සුමුදු ගුණවලින් හා බහුවිධ නිපුණතාවලින් යුත් සාමාජීය මිනිසෙකු බිහිකිරීම වේ. වත්මන් අධ්‍යපනයට නිශ්චිත අභිමතාර්ථ නැති බව ස්වාමි විවේකානන්දතුමා ප්‍රකාශ කොට ඇත. එතුමාට අනුව ප්‍රතිමා ශිල්පියා තමා කිරිගරුඬෙන් නෙලන ප්‍රතිමාව කුමක්දැයි දනී. සිත්තරා තම සිතුවම කුමක්දැයි දනී. එහෙත් ගුරුවරයා තමා උගන්වන සිසුවා කවරෙකු වේදැයි නොදනී. අවසන එතුමා සඳහන් කොට ඇත්තේ සාකල්‍යයෙන්ම මිනිසා සකස්කරන අධ්‍යාපනයක් (Man making eduation) අවශ්‍ය බවයි. ඒ අනුව 21වන සියවස සඳහා අධ්‍යාපනයේ කාර්යභාරය කවරාකාර යන්න පිළිබඳව ගවේෂණාත්මක අධ්‍යනයක් සිදු කිරීමට අපේක්ෂා කෙරෙයි.

**යතුරු පද:-** විෂයක්ෂේත්‍රය, අභිමතාර්ථ, සාම්ප්‍රදායික ඥාණය, දර්ශනය, කළමනාකරණය

**හැඳින්වීම**

ගෝලීයකරණයෙන් හෙවත් විශ්ව ගම්මාන සංකල්පය තුළින් නූතන ලෝකවැසියා එකම පවුලක සාමාජිකයෝ වෙති.

අතීතයේ මිනිසුන් අධ්‍යාපනය සොයාගිය නමුත් වර්තමාන මිනිසාට අවශ්‍ය සියල්ල තාක්ෂණයෙන් දැනගැනීමේ හැකියාව පවතී. එහෙත් බුද්ධියෙන් පමණක් මිනිසකු සම්පූර්ණ වේද යන්න පිළිබඳ පවතින්නේ ප්‍රශ්නාර්ථයකි. මේ නිසාම අධ්‍යාපනය මගින් උගතකු හා නිෂ්පාදකයකු බිහිකිරීම පමණක් නොව යහපත් මනුෂ්‍යකු ද බිහිකිරීම පිළිබඳ චිරාගත අධ්‍යාපන අරමුණ නැවත ඉස්මතු කොටගත යුතු බව පෙනෙයි. එසේම 21 වන සියවසේ ජීවත්වන වත්මන් මිනිසා ජීවිතයේ ශූන්‍ය කර්කෂභාවය නැතිකොට සමතුලිතභාවයන් ගොඩ නගනු වස් ජීවිතයේ යාන්ත්‍රික ස්වභාවයෙන් අත් මිදී කලා ශිල්ප, සාහිත්‍යය මෙන්ම සෞන්දර්ය විඥානය ද දියුණු කළ යුතු බව පෙනෙයි.

එසේම 'අධ්‍යාපනය' යන වචනයට නිශ්චිත අර්ථකතනයක් නොමැති සේම එය ලැබීමට නිශ්චිත කාලයක් හෝ ස්ථානයක් නොමැත. මේ නිසා අධ්‍යාපනය වූ කලී ජීවිත කාලය පුරාවටම ලැබිය හැකි යාවජීව ක්‍රියාවලියකි. 21 වන සියවසේ ජීවත් වන අපට අදට හා හෙටට ගැළපෙන විධිමත් වූත් සාරවත් වූත් කාර්යක්ෂම අධ්‍යාපන ක්‍රියාවලියක අවශ්‍යතාව මතුව ඇත. ඒ අනුව යමින් මෙම පර්යේෂණය තුළින් 21 වන සියවසට අවශ්‍යවන අධ්‍යාපනයේ කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකරනු ලැබේ.

**අධ්‍යාපනය**

විසි එක්වන සියවසට ගැළපෙන අධ්‍යාපනයක ස්වභාවය කෙසේ ගොඩනැගිය යුතුද යන්න සොයා බැලීමට පෙර අධ්‍යාපනය (education) යනු කුමක්දැයි කෙටියෙන් අධ්‍යයනය කිරීම උචිත යැයි හැඟේ. අධ්‍යාපනය යන්නට නිශ්චිත හා පරිපූර්ණ අර්ථ නිරූපණ දීම දුෂ්කර වන්නේ එහි පවත්නා සංකීර්ණ බව නිසාය. බුදුදහමට අනුව අධ්‍යාපනය 'යාවනිබ්බාන' ක්‍රියාවලියකි. එනම් නිවනින් පමණක් කෙළවර වන්නකි. දියමන්තියක් අතට ගත් විට එහි විවිධ හැඩ පෙනෙන්නාසේ අධ්‍යාපන සංකල්පය ද විවිධ පැතිකඩ නියෝජනය කරයි. පෙරාපරදිග වියතුන්ගේ නිර්වචන දෙස අවධානය යොමුකරන විට ඒ ගැන අපට ආසන්න අදහසක් ගොඩනගා ගත හැකිය.

''නියුමැටල් විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය පියරේ ගර්ටර් අධ්‍යාපනය හඳුන්වා ඇත්තේ 'මානව ශික්ෂාව' යන පදයෙනි. මේ

අනුව පුද්ගලයෙකුගේ සියලු විභව්‍යතාවන් ඉදිරියට ගෙන සංවර්ධනය කිරීමේ සංස්කෘතික ක්‍රියාවලිය'' (කුමාරදාස, 2000 : 134).

''ආර්.එස්. පීටර්ස්, අධ්‍යාපනය නිර්වචනය කරන්නේ ''ගැඹුරු දැනුමක් හා අවබෝධ ශක්තියක් ඇති සම්පූර්ණ මිනිසෙකු බිහි කිරීම'' ලෙසයි.''

දැනුම, කුසලතා, ආකල්ප, සහජ දක්‍ෂතා, සැඟවී ඇති හැකියාවන් ආදිය මතුකර දීම අධ්‍යාපනයයි. ඒ අනුව ඕනෑම පුද්ගලයෙකුගේ ඥානය, වින්දනය හා යත්නය නමැති අංශ තුන වර්ධනය කිරීමෙන් තමාටත් අන්‍යයන්ටත් ප්‍රයෝජනවත් පරිදි ජීවත්වීමට ආධාර කිරීම අධ්‍යාපනයෙන් සිදුවන බව පැහැදිලිය. පොදුවේ ගත් කල අධ්‍යාපනය යනු පුද්ගල සංවර්ධන ක්‍රියාවලියක් මෙන්ම සමාජ සංවර්ධන ක්‍රියාවලියක් ලෙස අර්ථ දැක්විය හැකිය.

අධ්‍යාපනය යනු ඉගෙනීමක් ලෙස නැතිනම් පාසල් වැනි ආයතන මගින් ඉගෙන ගැනීමක් ලෙස මීට දශක කිහිපයකට උඩදී පිළිගනු ලැබුව ද එම අදහස 21 වන සියවසට නොගැළපේ. ඒ අද අධ්‍යාපනය ජීවිතයේ අවසානය දක්වාම විස්තාරණය වූ අඛණ්ඩ ක්‍රියාදාමයක් වශයෙන් පිළිගන්නා බැවිනි. අද පන්ති කාමරයක් තුළ නිෂ්පාදනය කරන්නේ හෙට අපේ රටේ අනාගතයයි. මිනිසාට අධ්‍යාපනය තුළින් නිපුණයෙකු මෙන්ම ගුණවතෙකු ද විය හැකිය. අධ්‍යාපනයේ අරමුණ මෙම අංශ දෙකින්ම පෝෂිත පුද්ගලයකු බිහි කිරීමයි.

මනුෂ්‍ය ශිෂ්ටාචාරය තුළ මෙතෙක් ජීවත් වූ මිනිසාට වඩා තාක්‍ෂණික දියුණුවෙන්, ජනගහන ඝනත්වයෙන්, පරිසර හානියෙන්, සම්පත් හිඟයෙන්, නාගරික තත්ත්වයෙන්, සම්ප්‍රදායක් බිඳීමෙන්, ඒකලනය (alienation) වීමෙන් පසුවන්නකු පිළිබඳ අප නූතනයේ සිතිය යුතුය. එම තැනැත්තා බුද්ධිමය දියුණුව ලැබුවකු පමණක් නොව වඩා පරිපූර්ණ ගුණාංගයන්ගෙන් සහ අභියෝගවලට මුහුණදීමේ හැකියාවෙන් හෙබි පුද්ගලයකු විය යුතුය. (කාරියවසම්, (සංස්), 1995 : 78).

අධ්‍යාපනය පිළිබඳ නවතම සංකල්පයක් ලෙස හඳුන්වනු ලබන 'පුනරාවර්තන අධ්‍යාපනය' (recurrent education) අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයෙහිලා 21වන සියවසේ බිහි වූ ප්‍රථම නව අදහස වශයෙන් වැඩි දෙනෙක් සලකති. මෙය ප්‍රචලිතව ඇත්තේ නූතන අධ්‍යාපන ක්‍රමයට විකල්පයක් වශයෙනි. මෙය 21වන සියවසේ නව අධ්‍යාපන සංකල්පයක් වූ යාවජීව අධ්‍යාපන සංකල්පයටත් වඩා නවීනතම සංකල්පයකි. නව ලෝකයට ගැළපෙන අධ්‍යයන කාර්යයක ස්වරූපය කෙබඳු විය යුතුද යන්න මෙයින් වැඩි දුරටත් සාකච්ඡා කෙරේ. අනාගත ලෝකය සඳහා වූ අධ්‍යයනය මෙය යැයි බොහෝ වියතුන් පෙන්වා දෙති. මෙයින් පුද්ගලයාට ජීවිත කාලයේ විවිධ අවස්ථාවල වරින් වර අධ්‍යාපනය ලබමින්ද, රැකියාවල නිරත වෙමින්ද, ජීවිත කාර්යයන් කාර්යක්ෂමව කරගත හැකිය. වර්තමාන අධ්‍යාපනයේ පවත්නා ඇතැම් අර්බුද විසඳීමට ද හැකිය. පුනරාවර්තන අධ්‍යාපනය යටතේ කාට වුවද වයස් භේදයකින් තොරව කුමන අවස්ථාවකදී වුවද කොතැනකදී හෝ අධ්‍යාපනය ලද හැකිය.

**21 වන සියවසේ අධ්‍යාපනය**

විසි එක් වැනි සියවස සඳහා අධ්‍යාපන වාර්තාව හෙවත් ජැක්ස්ඩෙලෝ වාර්තාව පෙන්වා දෙන පරිදි ළමයා ලැබිය යුතු අධ්‍යාපනය ලෙස අපේක්ෂා කරනුයේ,

1. පෞද්ගලික සංවර්ධනය
2. සමාජ සංවර්ධනය
3. ශාස්ත්‍රීය සංවර්ධනය
4. ආගමික සංවර්ධනය
5. වෘත්තීය සංවර්ධනය

සිසුන් මෙයින් වෘත්තීය සංවර්ධනය අධ්‍යාපනයේ දී පළමු වන ස්ථානයට අපේක්ෂා කරන අතර ගුරුවරුන් එය පස්වන ස්ථානයට ඇතුළත් කර පෞද්ගලික සංවර්ධනයට පළමු ස්ථානයට අපේක්ෂා කරයි.

විසි එක් වැනි සියවසේ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දෙන්නේ හර විෂයමාලාවක් ලෙස පදනම් අධ්‍යාපනයක් වශයෙනි. මූලික දැනුම සඳහා ජීවත් වීම වෙනුවෙන් මෙම දැනුම ලබා දෙන අතර වඩාත් නැඹුරුතාවයක් දක්වන්නේ ශාස්ත්‍රීය අධ්‍යාපනයට නොවේ. ශාස්ත්‍රීය අධ්‍යාපනයට දැඩි නැඹුරුතාවයක් දැක්වීමෙන් ගුණාත්මක බවෙන් අඩු අධ්‍යාපනයක් ලැබේ. සාම්ප්‍රදායික විෂයමාලා මඟින් ශිෂ්‍ය කුසලතා මතු කර ගත නොහැකිය. විසි එක් වැනි සියවසේ දී ඉගෙනුම ලබන්නන්, ශිෂ්‍යයින් කේන්ද්‍ර කර ගත් ඉගෙනුමකට යොමු වෙයි. ශිෂ්‍යයා තුළ වෙනසක් ඇති කළ යුතුය. එය කළ හැකි එකම ක්‍රමය ද අධ්‍යාපනයයි. එහෙත් සාම්ප්‍රදායික ලෙස මෙතෙක් කරගෙන ආ ශාස්ත්‍රීය අධ්‍යාපනයට ප්‍රධාන තැනදීම නොවේ. වර්තමාන ගෝලීය අධ්‍යාපනය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගයක් වන්නේ දැඩි ලෙස වෙනස්වන ගෝලීය පරිසරයට උචිත අයුරින් වත්මන් ශිෂ්‍ය පරපුර අනාගත ඵලදායි පුරවැසියන් බවට පත් කිරීමයි. මෙය විෂයමාලාවට නව දැනුම ඇතුළත් කිරීම ලෙසට විග්‍රහ කළ නොහැකිය. මෙම වෙනසට අදාළ පරිදි ශිෂ්‍ය පෞරුෂය ගොඩනැංවීම ප්‍රධාන අභියෝගය වේ. නූතනයේ මිනිසාගේ මොළය කලාප පහකට වෙන් කරනු ලබයි.

1. බුද්ධිමය සංවර්ධන කලාපය

2. ශාරීරික සංවර්ධනය කලාපය

3. සදාචාර සංවර්ධන කලාපය

4. සමාජ සංවර්ධනය කලාපය

5. චිත්තවේග සංවර්ධන කලාපය වශයෙනි.

මෙම කලාප සංවර්ධනය කිරීම ශිෂ්‍යයකුගේ පෞරුෂ සංවර්ධනය ලෙස සැලකේ. මෙම කලාප පහ සංවර්ධනය කිරීම සඳහා අභියෝගය වී ඇත්තේ වෙනස්වන ගෝලීය තාක්ෂණික හා සමාජ පරිසරයට අනුව සංවර්ධනය කිරීමය.

බොහෝ සංවර්ධිත රාජ්‍යයන් අපේක්ෂා කරනුයේ විෂයමාලා පුද්ගල අනන්‍යතාව අනුව සංවර්ධනය කර භාවිත කිරීමය. එමගින් ඔවුන් අපේක්ෂා කරනුයේ ශිෂ්‍යයින්ගේ ආවේනික ස්වභාවික විභව

ශක්තිය දක්ෂතාව සංවර්ධනය කිරීමට අභියෝගාත්‍යතාව දියුණු කිරීමයි. එමගින් නව ඉගෙනුම් පරිසරයක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

විසි එක් වැනි සියවස සඳහා සංවර්ධිත ජාතීන් තම අධ්‍යාපන ක්‍රම තුළ නවමු ලෙස භාවිත කිරීමට මෙන්ම සිසුන් තුළ සංවර්ධනය කිරීමට අපේක්ෂිත නිපුණතාවයන් 7 ක් දක්වති.

1. නිර්මාණශීලී හා නවෝත්පාදන නිපුණතාව
2. විචාරාත්මක චින්තන නිපුණතාව
3. සහයෝගී නිපුණතාව
4. සන්නිවේදන නිපුණතාව
5. චරිතායන නිපුණතාව
6. සංස්කෘතිය හා සදාචාරාත්මක පුරවැසි බව පිළිබඳ නිපුණතාව
7. පරිගණක හා සංඛ්‍යාන්තික තාක්ෂණය පිළිබඳ නිපුණතාව ලෙසය.

මෙම නිපුණතාවන් සංවර්ධනය කිරීමේ දී සිසුන්ට හා ප්‍රජාවට මුහුණපෑමට ඇති දැඩි විවිධත්වය, වේගවත් වෙනස්වීම් හා මේ අනුව අනුගත වූ තාක්ෂණය අධ්‍යාපන විභව ශක්තීන් දියුණු කිරීමේ දී බලපෑම් කරයි. එහෙත් ගුරුවරුන් හා සිසුන් දැනට සාම්ප්‍රදායික විෂයමාලා අධ්‍යාපන රටාවලට අනුගත වී ඇත. මෙය නූතන වෙනසට අනුගත වී නැත.

එහෙත් නව තාක්ෂණික හා සමාජ වෙනසට අනුගතව ඉගැන්වීම හා අධ්‍යාපනය මෙහෙයවීම සමාජ ක්‍රමවේදයක් බවට පරිවර්තනය වී තිබේ. පාසලෙන් පරිබාහිර වූ සංඛ්‍යාංතික තාක්ෂණයකට ගුරුවරුන් හා සිසුන් කොටස්කරුවන් වී තිබේ. මෙහිදී, සහයෝගීතා නිපුණතාව, නිර්මාපී නිපුණතාව, නවොත්පාදක නිපුණතාව, සදාචාරාත්මක පුරවැසි බව යන නිපුණතා සිසුන් හා ගුරුවරුන් තුළ ද සංවර්ධනය කළ යුතුව තිබේ.

මේ අනුව සිසුන් හා ගුරුවරුන් තම ඉගෙනුම් - ඉගැන්වීම් සහයෝගීව සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම කළ යුතුව තිබේ. මේවා සංවර්ධනය කළ යුතු වන්නේ සමහර විටක පාසලින් ද පරිබාහිරවය. ඒවා සැලසුම් කළ යුතුය. ඒ අනුව සිසුන් තුළ චින්තන නිපුණතාව, පර්යේෂණ නිපුණතාව, විශ්ලේෂණ නිපුණතාව සංවර්ධනය කළ යුතුය. එමෙන්ම අදහස් සංවර්ධනය තම නවෝත්පාදන මගින් තියුණු ලෙස තේරුම් ගැනීමේ හැකියා වර්ධනය කළ යුතුය. මේ නිසා අධ්‍යාපනය සැලසුම් කිරීම හා දිශානති කිරීම පහත දැක්වෙන අයුරින් සිදු කළ යුතු වේ.

1. අධ්‍යාපන මූලධර්ම
2. විෂයමාලාව
3. අධ්‍යාපනය
4. ඉගෙනුම
5. පරිසරය
6. පාලනය
7. පුරවැසි සහභාගිත්වය

විසි එක් වැනි සියවසේ පළමු වන දශකයෙන් පසුව ඉගෙනුමෙහි ඵලය දැනුම නොව කුසලතා ලෙස සැලකීමට පටන්ගෙන තිබේ. මේ අනුව අධ්‍යාපනයෙහි අවසාන ඉලක්කය ජාතික සංවර්ධනයට යොමු වන්නේ දැනුම් ආර්ථිකයට යොමු කරමිනි. මේ නිසා අධ්‍යාපනය තුළ දැනුමට වඩා වැඩියෙන් අපේක්ෂා කරනු ලබන්නේ අධ්‍යාපනය හරහා මානව ප්‍රාග්ධනයයි. මානව ප්‍රාග්ධනය යන්නෙන් 21 වැනි සියවසෙහි අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රමිකයා ආයෝජනයක් ලෙසට පත් කරනු ලැබූ ශ්‍රමිකයාගේ, ශිෂ්‍යයාගේ කුසලතා සංවර්ධනයයි. මේ නිසා විෂයමාලාව ශිෂ්‍ය කුසලතාවලට හා ඒවා සංවර්ධනය කිරීමට යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. විසි එක් වැනි සියවසේ දෙවන භාගය වන විට අධ්‍යාපනයෙහි පාසල හා විශ්වවිද්‍යාලවලට අභියෝගයක් වන්නේ දැනුම කුසලතාවලට අනුවර්තනය කිරීමයි.

ගෝලීය අවශ්‍යතාවය වනුයේ ද එයයි. ඒ නිසා ගුරු පුහුණුව මඟින් ගුරුවරයා දැනුම මතු පරපුරට ලබා දෙන්නකු නොව කුසලතා මතු පරපුරට ලබා දෙන්නකු බවට පත් වී ඇත. දැනුම ලබා ගැනීමට තොරතුරු තාක්ෂණ මාධ්‍ය පවතින බැවින් ගුරුවරයා තව දුරටත් දැනුම සම්ප්‍රේෂණය කරන්නකු නොව කුසලතා ලබා දෙන්නකු ලෙස භූමිකා අනුවර්තනය කර ගනිමින් පවතී. මෙම 21 වන සියවසේ අධ්‍යාපනය තුළ සිදු වූ ගෝලීය වෙනස්කම් අනුව අධ්‍යාපනයට අදාළ වූ සියලු සංසිද්ධි වෙනස් විය යුතුය.

පුද්ගලයා සිය ප්‍රක්ෂේපණ (projection) හැකියාව ද වර්ධනය කර ගත යුතුය. (තමා ගැන මෙන්ම අන්‍යයන් පිළිබඳවත්, භෞතික ලෝකය පිළිබඳවත් වර්තමානයේ සිට අනාගතය දක්වා ස්වකීය දැකුම් තලය විකාශනය කිරීමට පුද්ගලයා සමත් වීමේ හැකියාව) අප තුළ විවිධ බලාපොරොත්තු තබා ගත යුතු අතර ඒවා සාක්ෂාත් කර ගැනීමට ද සමත් කමක් ලබාගත යුතුය. අද සමාජයේ දැනුම ප්‍රසාරණය (expansion) වීම අතින් වැඩි තත්ත්වයක පවතින හෙයින් පුද්ගලයාට පෙර මෙන් නොව නිරන්තරයෙන් දැනුම සෙවීමට සිදු වේ. පොත පතට පමණක් සීමා නොවී අලුත් දේ සිතන, අත්දැකීම් ලබන, නිර්මාණශීලි බවක් ඇති කරගත යුතුය. (උපතේ දීම මෙකී නිර්මාණශීලිත්වය ඇති අතර එය වර්ධනය කිරීම අධ්‍යාපනයෙන් සිදු කරනු ලබන කාර්යභාරයකි) විවිධ පුද්ගලයන්ට මෙය නන් අයුරින් පිහිටා ඇත. එම නිසා එය ආත්මීය යැයි පැවසේ. එමෙන්ම පරිකල්පන (imagination) හැකියාවෙන් යුක්ත (අතීතය හෝ අනාගතය පිළිබඳව මනෝමය වශයෙන් චිත්ත රූප මැවීමේ හැකියාවයි) උක්ත කරුණු මිනිසාට අධ්‍යාපනය ලැබීමත් සමඟ ලැබෙන අතර එය ලබාදීම අධ්‍යාපනයේ කාර්යභාරයකි.

පූර්වාදර්ශ නැති, ගැටලුවලින් යුක්ත ලෝකයක තමා මුහුණ දෙන නව තත්වයන්ට මුහුණ දීමේ කායික මානසික තත්ත්වය අධ්‍යාපනයෙන් ලබා ගත යුතුය. භෞතික පරිසරය වෙනස්වීමත් සමඟ ම අප තුළ පවත්නා යහපත් ආවේදනීය (affectivity) ගුණධර්ම හැර අන් සියල්ලට එකඟවීමට සිදු වේ. එසේ වෙනස් වන සියලු වෙනස්වීම් යහපත් අධ්‍යාත්මික තත්ත්වය වෙත හරවා ගැනීමට පුද්ගලයා සමත් විය යුතුය. ඒ සඳහා පුද්ගලයා අත්දැකීම් සහිත

තත්ත්වයකට පත් විය යුතු වේ. අනාගතයට මුහුණ දීමේ හැකියාව ලබා දීමද අධ්‍යාපනය මඟින් කළ යුතු කාර්යභාරයකි. ජීවත් වීමේ දී මිනිසුන්ට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වේ. එසේ පැමිණෙන ඕනෑම අභියෝගයකට නොසැලී මුහුණ දීමේ හැකියාව අධ්‍යාපනයෙන් පුද්ගලයාට ලබා දේ.

### 21 වැනි සියවසේ අධ්‍යාපනය

සාර්ථකත්වය අතීතයට වඩා වෙනස් ලෙස වර්තමානයේ පවතී. සාම්ප්‍රදායික රැකියා වෙළඳපොළෙන් ඉවත් වී තමන්ගේම රැකියා නිර්මාණය කිරීමට ඉහළ දක්ෂතා ඇති පුද්ගලයින් නිතර නිතර තෝරා ගනී. සාර්ථක පුද්ගලයින් වැඩි වැඩියෙන් බලාපොරොත්තු වන්නේ,

- ලෝකයේ ඕනෑම තැනක ජීවත් වන්න සහ වැඩ කරන්න
- ඔවුන් කැමති පරිදි නිතර සංචාරය කරන්න
- ඔවුන්ගේ රුචිකත්වයන් සහ හැකියාවන් අනුව ඔවුන් වැඩ කරන දේ වෙනස් කරන්න
- වැටුප් අගයකින් සීමා නොවූ ඉපැයීමේ හැකියාව භුක්ති විඳින්න
- ලොව පුරා සිටින සම වයසේ මිතුරන් සමඟ වැඩ කරන්න
- ඔවුන් කිරීමට අකමැති දේවල් බාහිරින් ලබා දෙයි
- ඔවුන්ගේම වේලාවන් සහ කාර්යාලය තෝරන්න

මේ ආකාරයෙන් ජීවත් නොවන මිනිසුන්ට එය දුරදිග යන බවක් පෙනෙන්නට තිබුණ ද, මේ ආකාරයේ ජීවන රටාව වේගයෙන් වර්ධනය වේ. මේ ආකාරයේ නිදහසක් සමඟ ප්‍රවේශ වීමට සහ දියුණු වීමට අවශ්‍ය වන්නේ කුමක්ද යන්න සඳහා 21 වැනි සියවසේ අධ්‍යාපනය යන්න දැක්විය හැකිය.

**20 වැනි සියවසේ අධ්‍යාපනය**

ශ්‍රීමත් කෙන් රොබින්සන් සිය 'Out of Our Minds' කෘතියේ 2011 සංශෝධිත සංස්කරණයේ පෙරවදනෙහි ලෝකය වඩාත් සංකීර්ණ වන තරමට එහි අභියෝගවලට මුහුණ දීම සඳහා අප වඩාත් නිර්මාණශීලී විය යුතු බව නිරීක්ෂණය කරන අතර මෙය වඩාත් පැහැදිලි වෙමින් පවතී. අධ්‍යාපනයේ සහ රැකියා ස්ථානයේ මිනිසුන් සාර්ථක වීමට නිර්මාණශීලී විය යුතුය. නමුත් සාර්ථකත්වය පිළිබඳ අදහස වෙනස් වී ඇතත් අධ්‍යාපන ක්‍රමය සෑම විටම එය සපුරාලීම සඳහා එහි ක්‍රම හෝ ඉලක්ක සකස් කර නැත.

20 වන ශතවර්ෂයේ අධ්‍යාපනයක් නිර්මාණශීලීත්වයට වඩා අනුකූලතාව අවධාරණය කරන ලදී. වෘත්තීය හෝ ආයතනික පරිසරයක හොඳින් වැඩ කිරීමට සහ දශක ගණනාවක් හොඳ රැකියාවක් කිරීමට අවශ්‍ය කුසලතව ලෙස අනුකූලතාව දැක්විය හැකිය. නමුත් ඒවා තවමත් බොහෝ පාසල්වල ප්‍රධාන වටිනාකම් වන අතර, සිසුන්ට ප්‍රකාශිත ලෙස ප්‍රවර්ධනය නොකරන විට පවා ප්‍රතිපත්ති පමණක්ම වේ. ඔහුගේ 'Who's Farid of the Big Bad Dragon' යන ග්‍රන්ථයේ අධ්‍යාපනික චින්තන නායක යොන්ග් ෂාඕ දක්වන්නේ ඉහළ මට්ටමේ පරීක්ෂණ මගින් බලාත්මක කරන ලද ජාතික ප්‍රමිතීන් සහ ජාතික විෂයමාලාව, නියම කර ඇති දේ සිසුන්ට හොඳම ලෙස ඉගැන්විය හැකිය යන්නයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දක්ෂ සිසුන්. වෙනත් ක්ෂේත්‍රවල එම දක්ෂතා සොයා ගැනීමට කිසිවිටෙක අවස්ථාවක් නොලැබේ. පුළුල් උනන්දුවක් ඇති සිසුන් අධෛර්යමත් කරනු ලැබේ. මෙම ක්‍රමයේ ප්‍රතිඵලය වන්නේ දක්ෂතා සහිත පටු පරාසයක සමාන කුසලතා ඇති ජනගහනයකි. නමුත් විශේෂයෙන්ම වර්තමාන සමාජය තුළ, බොහෝ ක්ෂේත්‍ර සඳහා නවෝත්පාදන සහ නිර්මාණශීලීත්වය අවශ්‍ය වේ.

අවාසනාවකට මෙන්, බොහෝ සිසුන් අතීතයේ සිටි ආකාරයටම අධ්‍යාපනය ලබමින් සිටින අතර, ප්‍රමිතිගත විෂයමාලාවක් කට පාඩම් කිරීම සහ පුද්ගලාරෝපිත පරීක්ෂාව හරහා එක ප්‍රමාණයකට ගැලපෙන වේගයකින් උගන්වනු ලැබේ. බොහෝ සිසුන් ඉගෙනීමට අරගල කරන්නේ ඔවුන් නොසැලකිලිමත් වීම සහ පෙළඹවීමක් නොමැති බැවිනි. යූ ටියුබ් වීඩියෝවක් නැරඹීමෙන් හෝ පරිගණක ක්‍රීඩාවක්

කිරීමෙන් එකම තොරතුරු වේගයෙන් ඉගෙන ගත හැකි නම් පාසල් යන්නේ ඇයි? පුද්ගලයා සතුව සියලු තොරතුරු තිබියදී පරීක්ෂණයක් සඳහා කරුණු කටපාඩම් කරන්නේ ඇයි? ඉගෙන ගන්නා සහ වෙනස් ලෙස සිතන වර්තමාන සිසුන්ට අතීත ක්‍රම එතරම් තේරුමක් නැති අතර, වෙනස්වන සේවා ස්ථානයට සාපේක්ෂව ඔවුන්ට එතරම් තේරුමක් නැත, එහිදී තොරතුරු භාවිත කිරීම දැන් දේවල් දැන ගැනීමට වඩා ඉතා වටිනා ය. සීඝ්‍ර වෙනසකට ප්‍රතිචාර දැක්වීමට සහ නව තොරතුරු හැසිරවිය යුතු ආකාරය සිසුන්ට ඉගැන්වීමට පාසල් අසමත් වන්නේ ඔවුන් යල් පැන ගිය ක්‍රමවලට ඇලී සිටින බැවිනි.

**21 වැනි සියවසේ සිසුන්**

Z Generation 1995 සහ 2009 අතර උපත ලද බොහෝ දෙනෙකුට අන්තර්ජාලයෙන් තොර ජීවිතය මතක නැති අතර ඔවුන්ගේ පාසල් අධ්‍යාපනයේ වැඩි කාලයක් පුරාවටම ස්මාර්ට් ෆෝන්, iPads, smartboards සහ වෙනත් උපාංග වැනි තාක්ෂණයක් ලබාගෙන ඇත. Generation Alpha 2010 සිට උපත ඔවුන් ස්මාර්ට් ෆෝන්, iPad, 3D රූපවාහිනිය, Instagram, සහ Spotify වැනි සංගීත ප්‍රවාහ යෙදුම් වලට වඩා දුර්වලය. 22 වැනි සියවසේ විශාල වශයෙන් දැකිය හැකි පළමු පරම්පරාව මෙයයි.

මෙම මට්ටමේ තාක්ෂණය සමඟ වැඩීම යනු ඇඟිලි තුඩුවල පෙර නොවූ විරූ තොරතුරු ප්‍රමාණයක් සමඟ වර්ධනය වීමයි. සෑම දෙයක්ම ඉක්මන් සෙවුමක් සමඟින් ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමට තත්පර කිහිපයකට වඩා දුරින් නොසිටි දරුවන් සිටිති. දරුවන් කැමති ඕනෑම මාතෘකාවක් ගැන තම නිදන කාමරයෙන් පිටව නොගොස් තමන්ටම කියා දීමට ඔවුන්ට හැකියාව ඇත. වර්තමාන සිසුන් සමූහය පැමිණෙන්නේ Generation සහ Alpha පරම්පරාවෙනි. මෙම පරම්පරා දෙක ඔවුන්ගේ නිවෙස්වල සහ පන්ති කාමරවල ලබා දී ඇති පරිදි උසස් තාක්ෂණයෙන් වැඩී ඇත.

අද පාසල්වල සිටින සිසුන් බුද්ධිමත්, ස්වාධීන සහ අතිශයින්ම දක්ෂය. ඔවුන් තාක්ෂණය සමඟ නිපුණතා ඇති අතර ගෝලීය හා අන්තර් සංස්කෘතික සන්නිවේදනය සමඟ කටයුතු කරයි. අනාගත පරපුරට මෙම ක්ෂේත්‍රවල මීටත් වඩා අත්දැකීම් ලැබෙනු ඇතැයි අපට අපේක්ෂා කළ හැකිය.

21 වන සියවසේ අධ්‍යාපනයයෙන් සිදු කරනුයේ සිසුන්ට මෙම නව ලෝකය තුළ සාර්ථක වීමට අවශ්‍ය කුසලතා ලබාදීම සහ එම කුසලතා ප්‍රගුණ කිරීමට ඔවුන්ට විශ්වාසය වර්ධනය කිරීමට උපකාර කිරීමය. ඔවුන්ට පහසුවෙන් ලබාගත හැකි බොහෝ තොරතුරු සමගින් 21 වන සියවසේ කුසලතා එම තොරතුරු අවබෝධ කර ගැනීම, බෙදාගැනීම සහ එය බුද්ධිමත් ආකාරයෙන් භාවිතා කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. 21 වන සියවසේ ඉගෙනීම සඳහා සඳහා කුසලතා. හතරක් හඳුනාගෙන ඇත

- නිර්මාණශීලීත්වය
- විවේචනාත්මක චින්තනය
- සන්නිවේදන
- එක්ව කටයුතු කිරීම

මෙම තේමා හතර තේරුම් ගත යුත්තේ ඒකක හෝ විෂයයන් ලෙස නොව, සියලු විෂයමාලා සිතියම්ගත කිරීම සහ උපාය මාර්ගික සැලසුම් හරහා ආවරණය කළ යුතු තේමා ලෙසය. නිර්මාණශීලිත්වය යනු තොරතුරු හරහා නව ආකාරයකින් සිතීම, නව සම්බන්ධතා ඇති කර ගැනීම සහ ගැටළු සඳහා නව්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමයි. විවේචනාත්මක චින්තනය යනු තොරතුරු විශ්ලේෂණය කිරීම සහ හිමිකම් විවේචනය කිරීමයි. සන්නිවේදනය යනු දේවල් පැහැදිලිව අන් අය සමඟ බෙදා ගැනීමට තරම් හොඳින් අවබෝධ කර ගැනීමයි. සහයෝගීතාවය යනු කණ්ඩායම් වැඩ සහ එහි කොටස්වල එකතුවට වඩා වැඩි කණ්ඩායමක සාමූහික ප්‍රතිභාවයි.

මෙම ක්ෂේත්‍ර හතරට අයත් වැදගත් වන වෙනත් කුසලතා තිබේ. ව්‍යවසායකත්වය තමන්ගේම කුසලතාවක් ලෙස සැලකිය හැකිය. අධ්‍යාපනය යනු ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයකට ඔරොත්තු දෙන, එහි අතීත අදාළත්වය සඳහා තෝරාගෙන ඇති නිර්දේශිත අන්තර්ගත නොවන මාරු කළ හැකි කුසලතා සහිත සිසුන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය වේ.

**ඩිජිටල් තාක්ෂණය**

21 වන සියවසේ පරිපූර්ණ අධ්‍යාපනයක් සඳහා ඩිජිටල් ඒකාබද්ධ කිරීම ද මූලික වන අතර, පවතින ඉගැන්වීම් ක්‍රමවලට තාක්ෂණය එක් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා තාක්ෂණය උපක්‍රමශීලීව භාවිත කළ යුතුය. සිසුන් ප්‍රථම වරට පාසලට ඇතුළු වන විටත් තාක්ෂණයේ දියුණු පරිශීලකයින් වේ. එබැවින් මෙය බොහෝ විට අදහස් කරන්නේ ඇතැම් වැඩසටහන් භාවිතය ඉගැන්වීමට සහ නිර්දේශ කිරීමට උත්සාහ කරනවාට වඩා ඉදිරිපත් කරන ලද හැකියාවන් සඳහා විවෘතව සිටීමයි. බොහෝ පන්තිකාමර තාක්ෂණ පන්තියක් ළමයින්ට තවදුරටත් අදාළ නොවන හෝ ගුරුවරයාට වඩා හොඳින් තේරුම් ගන්නා වැඩසටහන්, වෙබ් අඩවි සහ දෘඪාංග පිළිබඳව ඉගැන්වීමට උත්සාහ කිරීමෙන් දරුවන්ව ව්‍යාකූල කර ඇත.

**ජාත්‍යන්තර අධ්‍යාපනය**

21 වන සියවසේ පාසල් ද ජාත්‍යන්තර අධ්‍යාපනය වෙත ගමන් කරමින් ඉල්ලුමට ප්‍රතිචාර දක්වයි. ISC පර්යේෂණ ඔවුන්ගේ පර්යේෂණවල මෙම වෙනස්කම් නිරීක්ෂණය කර ඇත. අතීතයේදී, ජාත්‍යන්තර පාසල් මූලික වශයෙන් හමුදා නිලධාරීන්ගේ සහ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ පවුල් සඳහා විය. 2000 වර්ෂයේදී ගෝලීය වශයෙන් සිසුන් මිලියනයකට වඩා අඩු සංඛ්‍යාවක් සහභාගී වූ ජාත්‍යන්තර පාසල් 2,500 ක් තිබූ නමුත් 2016 දෙසැම්බර් මාසයේදී සිසුන් මිලියන 4.5 කට ආසන්න සංඛ්‍යාවක් සිටින ජාත්‍යන්තර පාසල් 8,600 කට වඩා තිබුණි. මෙම සිසුන්ගෙන් අතිමහත් බහුතරයක් දැන් බටහිර විශ්වවිද්‍යාලවලට යාමට බලාපොරොත්තුවෙන් සිටින දේශීය දරුවන් ය. සාම්ප්‍රදායික ජාත්‍යන්තර පාසල් නොවන පාසල් ද සංචාරක අවස්ථා, හුවමාරු වැඩසටහන්, පාසල් හවුල්කාරිත්වය, ජාත්‍යන්තර පාසල් නායකත්වය සහ මාර්ගගත සන්නිවේදනය හරහා ජාත්‍යන්තරව සම්බන්ධ අධ්‍යාපනයක් නිර්මාණය කිරීමට උත්සාහ කරයි. තාක්ෂණය දේශසීමා මකා දමන ලෝකයක ගෝලීය පුරවැසියෙකු වීමට ඉගෙන ගැනීම ඉතා වැදගත් වන අතර මෙය ඉගැන්වීමට ඇතුළත් කිරීමට උපාධියක් අවශ්‍ය නොවේ.

21 වන සියවසේ ගුරුවරුන් තම සිසුන්ට මාර්ගෝපදේශකයෙකු හෝ උපදේශකයෙකු ලෙස සේවය කළ යුතු අතර, ඔවුන්ගේ සියලු තොරතුරු ඔවුන්ට සපයන සියල්ල දන්නා ඥානවන්තයෙකු ලෙස නොවේ. සියලු වර්ගවල සම්පත් සඳහා බොහෝ ප්‍රවේශයන් සමඟින්, ළමයින් නිරන්තරයෙන් විවිධ මාතෘකා පිළිබඳව ගුරුවරුන්ට වඩා වැඩි යමක් දැන ගැනීමට සහ භාවිතයේ පවතින තාක්ෂණයට වඩා පියවරක් ඉදිරියෙන් සිටී. ගුරුවරුන් ඉගෙනීම සඳහා පහසුකම් සපයන්නන් සහ අභිප්‍රේරකයින් ලෙස බල ගැන්වීමට අවශ්‍ය වන අතර එමඟින් ඔවුන්ට තම සිසුන් සවිබල ගැන්වීමට හැකි වේ.

ගුරුවරයා එතරම් නොදන්නා ක්ෂේත්‍රවල සාර්ථක වීමට අවශ්‍ය සියලු තොරතුරු දරුවන්ට ලබා දීමට අරගල කරනවා වෙනුවට, ඔවුන් විවිධ ක්ෂේත්‍රවලට තම පියවර ගන්නා විට සිසුන්ට සහාය විය හැකිය. එය ඔවුන්ගේ දෙමාපියන් සහ ගුරුවරුන් ඉක්මවා යාමට දරුවන් සූදානම් කිරීම, එය කිරීමට ඔවුන්ට කුසලතා ඇති බවට වග බලා ගැනීම, සහ ඔවුන් සාක්ෂාත් කර ගැනීමට විශ්වාසය ගොඩනඟා ගැනීම සඳහා උපකාර කිරීමයි. මෙයින් අදහස් කරන්නේ ගුරුවරුන් ඉදිරියෙන් සිතන, කුතුහලයෙන් හා නම්‍යශීලී විය යුතු බවයි. ගුරුවරුන් ඉගෙන ගන්නන් විය යුතුය. ඉගැන්වීමේ නව ක්‍රම ඉගෙන ගැනීම සහ ඔවුන්ගේ සිසුන් සමඟ ඉගෙනීම. වසර විස්සක් හෝ පනහකින් සිසුන්ට අවශ්‍ය වන්නේ කුමක්ද? ඔවුන්ට එම කුසලතා ලබා දීමට උදව් කරන්නේ කෙසේද? මානසිකත්වය වෙනස් කිරීමට, නායකයෙකු බවට පත් කිරීමට සහ පන්තිකාමරයේ, පාසලේ සහ ප්‍රජාවේ වෙනසක් ඇති කිරීමට උදවු කළ හැකිය.

**21 වන සියවසේ පාසලක් සඳහා ප්‍රායෝගික උපදෙස්**

- උපාය මාර්ගික රැස්වීම් සහ තීරණ ගැනීම සඳහා දායක වීමට සිසුන්ට ආරාධනා කිරීම
- විවිධ ආකාරයේ සහයෝගිතා සහ කණ්ඩායම් වැඩ සඳහා ගැලපෙන අනුවර්තනය කළ හැකි ඉගෙනුම් පරිසරයන් නිර්මාණය කිරීම
- ප්‍රජා සේවා වැඩසටහන් වල හිමිකාරිත්වය ගැනීමට සිසුන් දිරිමත් කිරීම

- ලෝකයේ වෙනත් ප්‍රදේශවල සිටින ඔවුන්ගේ වයසේ සිටින පුද්ගලයින්ට සිසුන් සම්බන්ධ කිරීමට ක්‍රම සෙවීම

**පන්ති කාමරය තුළ තාක්ෂණය භාවිතය එය වඩාත් ඵලදායී කරගැනීම**

මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම යෞවනයන් මුහුණ දෙන විශාලතම අභියෝගයක් වන කාලයක 21 වන සියවසේ අධ්‍යාපනයක් මඟින් සිසුන්ට දැනට සහ අනාගතය සඳහා අවශ්‍ය කුසලතා ලබා දිය හැකිය. සන්නිවේදනය, විවේචනාත්මක චින්තනය වැනි කුසලතා රැකියා ස්ථානයෙන් ඔබ්බට ගමන් කරයි. ඔවුන්ට ඔවුන්ගේ ජීවිතයේ දුෂ්කරම කාලවලදී මිනිසුන්ට උපකාර කළ හැකිය. එය හොඳින් කිරීම, අරමුණ සහ අවධානය පිළිබඳ හැඟීමක් තිබීම සහ වැඩ සහ ජීවිතය පාලනය කිරීමට හැකිවීම යහපැවැත්මේ මාවතේ වැදගත් පියවරයන් වේ.

**ප්‍රතිඵලය**

විවේචනාත්මකව හා නිර්මාණශීලීව සිතීමට, අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහ සන්නිවේදනය කිරීමට ඇති හැකියාව සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීමටත්, සතුටින්, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමටත් ඔවුන්ව බලගන්වයි.

පාසල 21 වන සියවසට ගෙන ඒම සඳහා පසුපසින් යාම වෙනුවට පෙරමුණ ගැනීම, ක්‍රියාශීලීව දේවල් කිරීමට නව ක්‍රම සෙවීම සහ අධ්‍යාපන පද්ධතියෙන් පිටත ලෝකය සමඟ සම්බන්ධව සිටීම අවශ්‍ය වේ. පුළුල් පරිමානයේ වෙනසක් සඳහා පන්ති කාමරයේ සහ පාසල් ප්‍රජාව තුළ නායකත්වය අවශ්‍ය වේ, නමුත් සෑම ගුරුවරයෙකුටම තම සිසුන්ට සාර්ථක වීමට උපකාර කිරීමට වහාම පියවර ගත හැකිය.

21වන සියවසට උචිත අධ්‍යයනයකට අවශ්‍ය වැදගත් කරුණු කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

- **නව තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව** - පූර්වාදර්ශ නැති ලෝකයක පුද්ගලයාට විවිධ අංශවලින් නව ප්‍රවණතාවන්ට මුහුණ දීමට හැකියාව ලබා දිය යුතුය.

- **අනුවර්තන හැකියාව** - නවීන ලෝකයට අනුකූල වන පරිදි පුද්ගලයා හැඩ ගැසිය යුතුය. විශ්ලේෂණ හැකියාව - කරුණු වෙන් වෙන් වශයෙන් තෝරා බේරා ගැනීමට හැකියාව ලබා දිය යුතුය.

- **සංස්ලේෂණ හැකියාව** - වෙන් වෙන්ව පවත්නා දේ සමෝදානය කර බැලීමට හැකියාව ලබා ගත යුතුය. එයින් නිර්මාණශීලිත්වය වර්ධනය වේ.

- **ඇගයීම** - යම්කිසි දෙයක වටිනාකම නිශ්චය කිරීමේ හැකියාව ඇගයීමයි. එය පුද්ගල සිතැඟි අනුව බොහෝ විට සිදුවේ. මින් බැහැරව නිගමන ආදිය ලබා ගැනීමට පුද්ගලයා සමත් විය යුතුය.

- **අභියෝගවලට මුහුණ දීමේ හැකියාව** - පූර්ව දැනුවත්වීමකින් තොරව නොසිතූ මොහොතක නොසිතූ අයුරින් පැමිණෙන කුමන අභියෝගයකට වුවද මුහුණ දීමේ හැකියාව වර්ධනය කරගත යුතුය.

- **ඉගෙනීමට ඉගෙනීම** - ගතානුගතික ඉගෙනීමෙන් මිදී පුද්ගලයා යාවජීව අධ්‍යාපන ක්‍රියාවලියක නියැලිය යුතුය.

- **නිර්මාණශීලිත්වය** - නිදහස් මානසිකත්වයෙන් පුද්ගලයා මානව වර්ගයාට ප්‍රයෝජනවත් නව දේ නිර්මාණය කරීමට සක්‍යතාව වර්ධනය කරගත යුතුය.

- **සහනශීලිත්වය** - පුද්ගල විෂමතාවන් මධ්‍යස්ථව, උපේක්ෂා සහගතව ඉවසා සහජීවනයෙන් අන්‍යයන් සමඟ කටයුතු කිරීමට පුද්ගල නැම්යාව වර්ධනය කර ගැනීමද 21වන සියවසට අධ්‍යාපනයෙන් ඉටු විය යුතු අත්‍යවශ්‍යම කාර්යයකි.

- **ගැටලු විසඳ ගැනීමේ හැකියාව** - පුද්ගලයා තුළ ආත්මාර්ථය ක්‍රියාත්මක වන විට නොයෙකුත් චිත්ත වීපීන් නිසා පුද්ගලයා තුළ 'නිව්රෝසියා' වැනි විකෘති මානසික තත්ත්වයන් නිසා ඔවුනොවුන් අතර ඇතිවන ගැටලු විසඳ ගැනීමේ සක්‍යතාව තිබිය යුතුය.

- **සහකම්පනය** - අන්‍යයන්ගේ දුකේදී දුක්වීමටත් සැපතේදී සතුටුවීමටත් හැකියාව ඇති සංවේදී මිනිසුන් නූතන අධ්‍යාපන ක්‍රමයෙන් බිහි කළ යුතුය.

- **අරපිරිමැස්ම** - සීමාසහිත සම්පත් ඇති ලෝකයක අසිමිතව සම්පත් (ජලය ආදිය) පරිභෝජනය කිරීමෙන් වැළකිය යුතුය.

- **පරිසරහිතකාමිත්වය** - ''මිනිසාගේ තාක්ෂණික දියුණුව නිසා ඔහු මිහිකත සනසන්නකු නොව වනසන්නකු බවට පත්ව ඇත. අපේ ඉරණම රඳා පවතින්නේ 'මිහිකත සෞඛ්‍ය' මතය. එය රැකීමට හා පෝෂණයට අප හවුල් විය යුතු බව අභ්‍යන්තරීකරණය හෙවත් චරිතායනය කළ යුතු වේ'' (කාරියවසම්, (සංස්), 1995 : 83).

- **සමාජීය දක්ෂතා**- සමාජ සබඳතා ගොඩනගා ගැනීමට මෙයින් හැකියාව ලැබේ. පුද්ගලයා ඒකලනය වීම නැතිනම් හුදෙකලා භාවයට පත්වීම වෙනුවට ප්‍රජාව සමඟ සාමූහිකව ජීවත්වීමට යොමු විය යුතුය.

- **සෞන්දර්යකාමිත්වය** - විද්‍යා තාක්ෂණයේ දියුණුව නිසා එන්න එන්නම ස්වභාව ධර්මයෙන් දුරස් වන මිනිසා යාන්ත්‍රික වීම නැති කර ගැනීමට වින්දනාත්මක හැඟීම් දියුණු කර ගත යුතුය. ඒ සඳහා පුද්ගලයා නැටුම්, වැයුම්, ගැයුම් ආදී විවිධ කලා ආදියට මෙන්ම ස්වභාව සෞන්දර්යය තුළින් වින්දනයක් ලැබීමටද පොහොසත් විය යුතුය.

- **අන්‍ය සංස්කෘතීන් අගය කිරීම** - පුද්ගලයා උපතින් පසුව අනුගත වන්නේ තමා අයත් සංස්කෘතියටයි. ඔහු ලෝකය අවලෝකනය කරන්නේ එම සංස්කෘතික රාමුවේ සිටය. නමුත් පුද්ගලයා සමාජය නිවැරදිව හඳුනා ගැනීමට නම් අන්‍ය සංස්කෘතීන් පිළිබඳ අවබෝධයද තිබිය යුතුය. සංවෘත නොවී විවෘත විශ්ව සමාජයක් කරා යන විට අන්‍ය සංස්කෘතීන් අගය කිරීමටද 21වන සියවසේ අධ්‍යාපනය තුළින් පුද්ගලයා නැඹුරු කළ යුතුය.

- **ප්‍රජාතාන්ත්‍රික පෞරුෂයක් ගොඩ නගා ගැනීම** - ප්‍රජාතන්ත්‍රවාදීව, සියලු මිනිසුන්ට සමව භේදයන්ගෙන් තොරව සියල්ලන්ට සමව කටයුතු කිරීමෙන් පුද්ගලයින්ට ස්වකීය විභව සම්පන්නභාවයන් මුදුන් පමුණුවා ගැනීමට හැකිවේ. එනම් තම සියලු කටයුතුවලදී මනුෂ්‍ය ගෞරවයෙන් කටයුතු කිරීමට පුද්ගලයා යොමු වීමයි.

- **ජාතිකාභිමානය** - හැම විටම පුද්ගලයා ''ජාතිය රන් විමනක් වේ'' යන අදහසට එකඟව කටයුතු කරන්නට යොමු විය යුතුය. ඔහු දේශීයත්වය අගය කළ යුතු පුද්ගලයකු වීම යෝග්‍යය.

- **ලෝකාභිමානය** - අද ලෝකය විශ්ව ගම්මාන තත්ත්වයද ඉක්මවා ගොස් තාක්‍ෂණය හරහා විශ්ව පවුලක් බවට පත්ව ඇත. ඒ අනුව සෑම විශ්වීය සත්ත්වයකුටම, ගෞරවය, ආදරය දැක්වීමට නූතන අධ්‍යාපන ක්‍රමය හරහා මිනිසා මෙහෙය විය යුතුය.

- **සැබෑ ඉගෙනීම** - නූතනයේ ලොව පවත්නා විවිධ ප්‍රශ්න හා ගැටලු තුළින් අද්දැකීම් සහිත ප්‍රායෝගික අධ්‍යාපනයක් ලබා දිය යුතුය.

- **මානසිකත්වය ගොඩනැගීම** - යහපත් පුරවැසියකු බිහිකිරීමට නම් ඔහු යහපත් මානසිකත්වයක් ඇත්තෙකු බවට අධ්‍යාපනය හරහා පත් කළ යුතුය.

- **අභ්‍යන්තරික අභිප්‍රේරණය** - ඉගෙනීමේ නියම, සාර්ථක ක්‍රමවේදයන් භාවිත කිරීමට හා ධනාත්මක චිත්තවේගී සබඳතාවන් හඳුනා ගැනීමටත් යෙදවීමටත් පුද්ගලයා යොමු කිරීම හෙටට ගැළපෙන, ප්‍රායෝගික වන අධ්‍යාපනයේ කාර්යභාරයකි. එසේම ඉගෙනීමේ හා ඉගැන්වීමේ කුසලතා වැඩි දියුණුව පිණිස ලෝකය පුරා පවත්නා විවිධ ක්‍රමවේදයන් භාවිතයට ගත යුතුය.

එසේම නූතනයට නැතිවම බැරි අත්‍යවශ්‍ය දැනුමක් වන පරිගණක සාක්ෂරතාව ද සෑම දෙනාටම ලබා දීමට රජය මැදිහත්ව හෝ කටයුතු කළ යුතුය. ඉගැන්වීම සඳහා නූතනයේ පවතින ශ්‍රව්‍ය

දෘශ්‍ය මාධ්‍යයන්ද උපයුක්ත කර ගත හැකිය. ඒ අනුව දැනුම පොත පතට පමණක් සීමා නොවන විධිමත් ප්‍රායෝගික අධ්‍යාපනයක් කරා යා හැකිය. එහිදි අධ්‍යාපනය තුළින් බිහි කරන පුද්ගලයා තුළ පහත ලක්ෂණ තිබිය යුතුය.

a) දිවි පැවැත්මට ඉගෙනීම

b) යමක් කිරීමට ඉගෙනීම

c) ඉගෙනීමට ඉගෙනීම

d) සාමූහිකව ජීවත්වීමට ඉගෙනීම ආදියයි.

ඉහත නිපුණතාවන් හා ගුණාංග චරිතායනය වන පරිදි අධ්‍යාපනය සකස් කිරීම අපහසු කාර්යයකි. ඒ සඳහා උචිත කලානුරූපව වෙනස් වන විෂයමාලාවක් (curriculum of change) මෙන්ම ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමවල ද වෙනසක් ඇති කළ යුතුය. විශේෂයෙන්ම කුමන හෝ විෂයක් ඉගැන්වීමේදී අනාගත දෘෂ්ටි කෝණයකින් සිතීමට, නිර්මාණයට හා පරිකල්පනයට සිසුන් යොමු කළ යුතුය. ඒ හරහා ඔවුන් අධ්‍යාපනයේ නව දිශානතියකට යොමු කළ හැකිය. එනම් නූතනයට උචිත අධ්‍යාපන සැලැස්මකට සිසුන් යොමු කල යුතුය. ඒ ඊයේ අධ්‍යාපනය අදට සුදුසු නොවේ නම් එය හෙටට කිසිසේත් සුදුසු නොවන බැවිනි.

මේ අනුව අධ්‍යාපනය යනු පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කරමින් පුද්ගල හැකියාවන් පිටතට මතු කොට ඒ තුළින් පූර්ණ මිනිසෙකු බිහිකිරීම සහ සමාජ සංවර්ධනය කිරීම පෙරටුකොටගත් වැදගත් සංකල්පයක් බව පැහැදිළිය.

**විසි එක්වන සියවසට අවශ්‍ය වන අධ්‍යාපනයේ කාර්යභාරය**

සමාජය ඉතා සීඝ්‍රයෙන් දියුණු වන විට අධ්‍යාපනය ද ඊට සරිලන අයුරින් සංවර්ධනය වීම අවශ්‍යය. පුද්ගලයා අධ්‍යාපනයට කායික, මානසික සහ චිත්තවේගීය වශයෙන් සම්බන්ධ වීම අවශ්‍යයය. ඕනෑම පුද්ගලයෙකුගේ ඥානය, වින්දනය හා යත්නය නමැති අංශ තුන වර්ධනය කිරීමෙන් තමාටත් අන්‍යයන්ටත් ප්‍රයෝජනවත් පරිදි

ජීවත්වීමට සුදුසු වටපිටාවක් අධ්‍යාපනයෙන් සැකසිය යුතුය. එසේම අධ්‍යාපනය හුදෙකලා නොවී පුද්ගලබද්දව ක්‍රියාත්මක විය යුතුය.

පාසල් වැනි ආයතන මගින් සාම්ප්‍රදායික විෂයීය දැනුමක් ලෙස පමණක් මීට දශක කිහිපයකට උඩදී පිළිගත් අධ්‍යාපන ක්‍රමවේදය වත්මනට යෝග්‍ය නොවේයැයි හැඟේ. එසේ වනුයේ නූතන අධ්‍යාපනය උපතේ සිට ජීවිතයේ අවසානය දක්වාම බලපවත්නා වූ අඛණ්ඩ ක්‍රියාදාමයක් වශයෙන් පිළිගන්නා නිසාවෙනි. මිනිසාට අධ්‍යාපනය තුළින් බුද්ධිමතෙකු මෙන්ම ගුණවතෙකුද විය හැකිය. මේ නිසාම නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය මෙම අංශ දෙකින්ම පෝෂිත පුද්ගලයකු බිහි කිරීමෙහිලා සමර්ථ වීම වැදගත්ය.

නූතන ලෝකයේ අධ්‍යාපන අරමුණු සහ පරමාර්ථ රැසක් දක්නට ලැබේ. පරමාර්ථ රටින් රටට වෙනස් වේ. පරමාර්ථ වනාහි කිසියම් විධිමත් ක්‍රියාවලියක, ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අවසාන ප්‍රතිඵලයයි. පරමාර්ථයන් පුළුල් සංකීර්ණ ස්වභාවයක් උසුලන නිසාම එය ඉටුකර ගැනීම අපහසුය. මේ නිසා ඒ සඳහා ගොඩනගා ගනු ලබන සුවිශේෂී ප්‍රකාශනයන් අරමුණු ලෙස හැඳින්වේ. මෙම අරමුණු ජාත්‍යන්තර වශයෙන් ද පවතී. එසේ ප්‍රචලිත වූ 21ක් වන සියවසට උචිත අධ්‍යාපනික අරමුණු හා සංකල්ප කිහිපයක් විග්‍රහ කිරීම මෙහිලා යෝග්‍යය.

අධ්‍යාපන ක්‍රමය විසි එක්වන සියවසට වෙනස්වීමේ දී එහි ගුණාත්මකභාවය පිළිබඳ සැලකිලිමත් වීම ඉතා වැදගත්ය. සීත කාමරවලදී දෙතුන් දෙනකු එකතුව සිදුකරන ප්‍රතිසංස්කරණ තුළින් අනාගත පරපුරක් අනතුරට ලක්වේ. එබඳු ප්‍රතිසංස්කරණ කෝල්බෲක් අධ්‍යාපන මූලධර්ම වලින් ඔබ්බට ගොස් නැත. දැනට පවතින අධ්‍යාපන ක්‍රමය පටන් ගන්නා ලද්දේ 1830 කෝල්බෲක් කැමරන් ව්‍යවස්ථා සංශෝධන යෝජනා අනුවය. බ්‍රිතාන්‍යයන් ලංකාවට පාසල් පද්දතියක් ලබාදී අපේක්ෂා කළේ යටත් විජිත පවත්වා ගැනීම සඳහා අඩු වියදමින් නඩත්තු කළ හැකි නිලධාරි මණ්ඩලයක් බිහිකරවා ගැනීමයි. නමුත් අප ඉහත කී කෝල්බෲක් අධ්‍යාපන ක්‍රමයෙන් ඔබ්බට ගියේ ද? නැත. ගොඩනැගිලි හැදීම - නිල ඇඳුම් - පොත්දීම වැනි සියලු භෞතික පහසුකම් ලබාදීම ද ඇත්ත වශයෙන්ම බ්‍රිතාන්‍යයන්ගේ අදහස් සඵල කිරීමකි. එබැවින් මූලික පරමාර්ථයේ සිට මුළු අධ්‍යාපන

පද්ධතියම වෙනස් කළ යුතුය. රටේ ශිෂ්ටාචාරය බිහි කළ මිනිසුන්ගේ අනාගතය වඩාත් යහපත් කිරීමට අධ්‍යාපනය සකස් කළ යුතුය. ඉතිහාස ධාරාවට නූතන ලෝකය තුළ අඛණ්ඩතාවක් ලබාදිය යුතුය. වසර 2500 ට වඩා ලිඛිත ඉතිහාසයකට පුරාවිද්‍යා සාධක පවා ඇති බුදුදහමින් පෝෂණය වූ ද එය පදනම් කරගත් ක්‍රමවේදයක් සැකසිය යුතුය. නමුත් අපට ඉගැන්වීම හරහා බටහිරට අවශ්‍ය සංස්කෘතික වහළුන් පිරිසක් බිහිවෙනු දැකිය හැකිය. සෑම පෙළ පොතකටම සුදු මිනිසුන්ගේ කිනම් හෝ සංකල්පයක් ඇතුළත් කොට ඇත. ඒ තුළින් ළමා මනස බටහිර සංස්කෘතියට නැඹුරු කොට ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය සිදුකිරීමේදී පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

01. අරමුණු - ජාතික අරමුණු, ප්‍රාදේශිය අරමුණු, පුද්ගල අරමුණු.

02. විනය - ශිෂ්‍යය විනය, ජාතික විනය.

03. විෂය අන්තර්ගගතය - වයස් කාණ්ඩ, ඉගැන්වීමේ ක්‍රමය, ප්‍රවීනත්‍වය ලබාගත යුතු අංශවලට බෙදීම.

04. ගුරුවරුන්ගේ තත්‍වය - වැටුප්, පුහුණු, ගුරු මාරුවීම් සහ උසස්වීම්.

05. අධ්‍යාපන පරිපාලනය - බඳවා ගන්නා පුද්ගලයන්ගේ තත්‍වය සඳහා බඳවා ගැනීම, තනතුරුවල

සේවය කරන කාලය, ප්‍රාදේශීය තලයේ සිට ජාතික තලයට සම්බන්ධීකරණය, ශ්‍රේණිවල ක්‍රමවත් බව.

ඉහත අංග මූලික ජාතික අරමුණු පදනම් කරගත්තක් සහ එය යථාර්ථයක් වීමට පිටිවහලක් වන සේ සකස්විය යුතුය.

### අරමුණු

ජතික අරමුණක් සාක්‍ෂාත් කරගැනීම විෂයෙහි අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස්විය යුතුය. එම නිසා අප තෝරාගන්නා ජාතික

අරමුණ කුමක් ද? සංස්කෘතික අරමුණ කුමක් ද? ඊට උපස්ථම්භකයක් ලෙස විෂය අන්තර්ගතය සකස්විය යුතුය. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පුද්ගල විනය ඇති කරයි. (විද්‍යා දදාති විනයං) තේමාව අපට කොතරම් ගලපා ගත හැකි ද? පුද්ගල සතුට පවතින ලෙස භෞතික සංවර්ධනය ඇතිවිය යුතුය. යුරෝපීය සමාජය තුළ ප්‍රචණ්ඩත්වයට හේතු වී ඇත්තේ විනයධර පුරවැසියෙකු බිහිවීමට ඉගෙනුම් ක්‍රියාවලිය සකස් නොවීමය. සංස්කෘතික අරමුණු ලෙස ජාති විවිධත්වය වෙනුවට ඒකීය ජාතියක් බිහි කළ යුතුය. සැබෑ දේශ සීමා ඇත්තේ මිනිස් සිත්වල මිස මහ පොළව මත නොවේ. මේ ස්වභාවය නැති කළ හැක්කේ එකම මහා සංස්කෘතියකට සියල්ලන් අවශෝෂණය වන අධ්‍යාපන ක්‍රමයකිනි. එය 'ඉගෙනීම විනය ඇති කරයි' යන සංකල්පයට අනුව දැනට පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ යුතුය.

ප්‍රාදේශීය අරමුණු ලෙස අදහස් කරන්නේ රට පුරා බෙදී ඇති සම්පත් සහ භූගෝලීය පිහිටීම අනුව ප්‍රදේශ මූලික සංවර්ධනය සඳහා රටවැසියා සූදානම් කරවීමේ අවශ්‍යතාවයි. සියල්ල සඳහා නගරයට මූලිකත්වය දීමෙන් දේශීය නිපැයුම අඩාල විය. අල්පේච්ඡත්වයෙන් තොරව සංකර විලාසිතාවලට හුරුවීමෙන් ගමේ ප්‍රාග්ධනය පිට රටට පොම්ප විය. එම නිසා ස්වදේශීයත්වය මූලික කරගත් අධ්‍යාපන ක්‍රමයක් බිහිවිය යුතුය. යුරෝපීය ක්‍රමයේ ජාතික දියුණුවක් අපට සුදුසු ද? පිරිසකට පමණක් සීමාවන අධිවේගී මාර්ග වැනි ව්‍යාපෘති අපට සුදුසු ද? දෙමව්පියන් නොහඳුනන දරුවන් පිරිසක් බිහිවන අධ්‍යාපනයක ඇති වැදගත්කම කුමක් ද? යැයි විමසිය යුත්තකි.

**විනය**

අධ්‍යාපනය තුළට විනය අවශ්‍යම අංගයකි. බුදුන් වහන්සේ ශිෂ්‍යයෙකු ගුරුවරයාට දැක්විය යුතු යුතුකම් පහෙන්ම විනය සකස් කරයි. ඉගෙනීමට සුදුස්සකු වීමටත්, ඉගෙනුම අතරමැදදීත් සහ අවසානයේත් විනය අවශ්‍ය වේ. සිඟාලෝවාද, වසල, මංගල, ව්‍යග්ගපජ්ජ ආදී සූත්‍රවල අන්තර්ගතය ප්‍රාථමික අධ්‍යාපනයට පිවිසිය යුතුය. නමුත් එකිනෙකා පරයා ඇදෙන ශිෂ්‍යත්වය වැනි තරඟයකට ළමුන් හුරු කිරීම තුළින් දයා විරහිත සමාජයක් බිහිවෙයි. ඔවුන් රටේ තීරණ ගන්නා යුගයක් කොතරම් බරපතල තත්වයක් උදාවේද? සොබා දහම සහ ජාතික අරමුණු සහිත ශාස්ත්‍රීය දැනුම එන්නත්

කිරීමටත් නීතිය, ඉගෙනුම් හැකියාවන්, ශිල්පීය හැකියාවන් වර්ධනය වන අයුරින් අධ්‍යාපනය සැකසිය යුතුය. ශිෂ්‍යයන් නිරතුරුව පාසල තුළ රඳවා ගත යුතු අතර ඔවුන්ගේ විනය නිරතුරුව පරීක්ෂා කළ යුතුය. බාහිර පංතිවලට සහභාගිත්වය අවම කළ යුතු අතර ඒ තුළින් ළමා මනස සුරක්ෂිත වේ. මේ සඳහා පාසලට පැමිණීම 90% ක් කළ යුතුය. පෞද්ගලික අයදුම් කරුවන්ගේ සමත්වීමේ ලකුණු මට්ටම ඉහළ දැමිය යුතුය. පාසල්වල අධ්‍යාපනය තුළ ළමයින් ධෛර්යමත් කළ යුතුය.

**විෂය කරුණු සහ පෙළ පොත්**

ප්‍රාථමික අධ්‍යාපනය තරඟකාරීත්වයෙන් තොරව සකස්විය යුතුය. මේ අවධිය ක්‍රමිකව සකස්විය යුතුය. මේ අවධියේදී ආචාර විද්‍යාත්මක හැසිරීම් රටා හුරුකිරීම, දයා පෙරදැරි සිතුවිලි, උදාර බලාපොරොත්තු රෝපණය කළ යුතුය. මේ අවධියේ සුභාෂිතය, සිරිත් මල්දම, පංචතන්ත්‍රය, ධම්මපදය ආදිය ඉගැන්වීම තුළින් භාෂා දැනුම ඇති කළ යුතුය. සම්ප්‍රදායික කලා ඇසුර තුළින් මටසිළුටු ගති පැවැතුම් ඇති කළ යුතුය. ජාතික වීරයන්ගේ කතා තුළින් අභිමානය ඇති කළ යුතුය. ද්විතීයික අධ්‍යාපනය ශාස්ත්‍රීය දැනුම සඳහා මූලික විය යුතුය. බෞද්ධ සූත්‍රාගත කරුණු සහ පෙරදිග දැනුම ඊට ඇතුළත් කළ යුතුය. උසස් අධ්‍යාපනය තුළදී පොදුවේ ඉගැන්වෙන ආචාර විද්‍යාත්මක දේවල්, මව් බස සහ ජාත්‍යන්තර භාෂා අනිවාර්ය කළ යුතුය. අධ්‍යයන විෂය පරාශය පුළුල් කළ යුතුය. තාරකා විද්‍යාවේ බොහෝ සොයා ගැනීම් සප්ත සූර්යොත් ගමන වැනි සූත්‍රවල තිබියදී ගැලීලියෝගේ පසුකාලීන ඉගැන්වීම් ඉගැන්වීමට ධනය වැය කිරීම හාස්‍යට කරුණකි. උද්භිද විද්‍යාවට ලක්දිව ශාකවල වටිනාකම උගන්වන්නේ නැත. අප රටේ ජන ක්‍රීඩා, සටන් ක්‍රම උගන්වන්නේ නැත. ආයුර්වේදය, රෝග නිවාරණ ක්‍රම, ගුප්ත විද්‍යා පරීක්ෂණ, නක්ෂත්‍රය ආදිය උගන්වන්නේ නැත. සම්ප්‍රදායික කෘෂිකර්මය ආදිය උගන්වන්නේ නැත. මේවා අප රටේ අධ්‍යාපනයට ඇතුළත් විය යුතුය. පෞද්ගලික වේවා ජාතික වේවා ප්‍රාදේශික වේවා ගැටලුවක් ඇතිවූ විට ඒවා විසඳීමට රුකුල්දෙන සූක්ෂම අධ්‍යාපන ක්‍රමයක් සකස් විය යුතුය. වැරදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම වෙනස් කිරීමට තොරතුරු ලබාගන්නා මූලාශ්‍ර සහ ඇගයුම් ක්‍රමය වෙනස් කළ යුතුය. මූලික ඉගැන්වීම් ක්‍රම දෙකකි.

01. ඒක මාර්ග මූලාශ්‍ර ඇගයුම් ක්‍රමය

02. බහු මාර්ග මූලාශ්‍ර ඇගයුම් ක්‍රමය

ඉහත ක්‍රම දෙකින් බුදුරදුන් අනුමත ක්‍රමය වූයේ දෙවැන්නයි. එය කාලාම සූත්‍රය තුළදී ප්‍රකට විය. ලංකාවේ අධ්‍යාපනය ද කාලාම සූත්‍රය පදනම් කරගෙන සැකසිය යුතුය. එය නියම ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයයි. වීමංසක, රාහුලෝවාද, කාලාම සූත්‍ර හරහා යමක් සම්බන්ධ වෙනස් වෙනස් මත මූලාශ්‍ර ලබාදී ශිෂ්‍යයාට මැදිහත්ව බලා පිළිතුරු ලිවීමට හුරු කළ යුතුය. විට්ගින්ස්ගන්ටයින් නමැති ජර්මන් දාර්ශනිකයා පැවසුවේ භාෂාව පිළිබඳ නොදැනුවත් බව සියලු දාර්ශනික ගැටලුවලද මුල බවයි. එම නිසා පුද්ගලයාට යමක් අවබෝධයට අවශ්‍ය භාෂා දැනුම ක්‍රමයෙන් වර්ධනය වන අයුරින් විෂය කරුණු සැකසිය යුතුය. උසස් පෙළ සිසුන්ට අනිවාර්ය විෂයක් ලෙස සිංහල භාෂාව සහ බෞද්ධ ආචාර විද්‍යා කරුණු ඇතුළත් විෂයක් සකස්විය යුතුය.

### ගුරුවරුන්ගේ තත්වය

අතීතයේ ගුරුවරයා ගෞරවාන්විත පුද්ගලයෙකු විය. වර්තමානයේ යම් යම් හේතු මත ගුරුවරයාගේ ගෞරවය ගිලිහී ගොස් ඇත. විවෘත ආර්ථිකය මත මූල්‍යමය පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා උදාර ගතිවලින් සමහරක් අතහැරීමට ගුරුවරයාට ද සිදුවී ඇත. මේ තත්‍වයට දේශපාලනය මූලිකම හේතුව විය. ගුරුවරුන් කරදරකාරී පිරිසක් ලෙස සලකා සුළු වැටුපක් ගෙවීය. දේශපාලනය මත අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසි සුදුසුකම් නොලත් ආචාර්යවරුන් නිසා ගුරු භූමිකාව විනාශ විය. එම නිසා ඒ හා සම්බන්ධ සියලු අංශ බිඳ වැටිනි. මේ තත්‍වය මඟ හැරීමට නම් ගුරු වෘත්තිකයන් සුදුස්සන් පිරිසක් කළ යුතුය. නුසුදුස්සන් ඉන් ඉවත් කළ යුතුය. වාර්ෂිකව පරීක්ෂා කොට ගුරුවරුන්ගේ දක්ෂතාවයන් අනුව වේතනය ඉහළ දැමිය යුතුය. ඒ ඒ ගුරුවරු යටතේ ඉගෙන ගනු ලබන ශිෂ්‍යයන්ගේ දැනුම තුළින් ගුරුවරයා අධ්‍යනය කළ යුතුය. පන්ති වාර්තා පොත් පරීක්‍ෂණය වැනි නොවැදගත් ක්‍රියා තුළින් එය සිදු කිරීම සාර්ථක නැත. ගුරුවරුන්ට නිල ඇඳුමක් ලබාදීම, ගුරු සේවයේ සහ විදුහල්පති සේවයේ සියලුම වැටුප් විෂමතාවන්ට පිළියම් යෙදිය යුතුය. ගුරුවරයාට බලපෑමකින්

තොරව දැනුම සම්ප්‍රේෂණය විය යුතුය. ඒ තුළින් යහපත් දරු පිරිසක් රටට බිහිවේ. ගුරුවරුන් නිරන්තරයෙන් දැනුම එකතු කරවා ගැනීමට යොමු කළ යුතුය. පැරණි සාහිත්‍ය, සංස්කෘතික වටිනාකම්, විද්‍යාත්මක අංග, ඉතිහාස තොරතුරු, ආගමික කෘති අනුමත කිරීම ආදිය තුළින් ගුරු විභාග වලදී ඒ සම්බන්ධව විමසිය යුතුය. එය පෙරදිග අධ්‍යාපනයට පෙළඹවීමට හේතුවක් වන අතර මේවායේ වාසිය ශිෂ්‍යයන්ට ද ලැබීම අස්වැසිල්ලකි.

**ශිෂ්‍යයාගේ ස්වභාවය**

නූතන ලොවට ඔබින නිපුණතා හා ගුණාංග වලින් පෝෂිත පරිපූර්ණ මිනිසකු බිහි කිරීම ඉතා අභියෝගාකාර ක්‍රියාවලියක් බව පැහැදිලිය. ඒ සඳහා වෙනස් වන විෂයමාලාවක් මෙන්ම ඉගැන්වීම් ශිල්පීය උපක්‍රමවල විප්ලවීය වෙනස්වීමක් අවශ්‍යවන බව මෙහිලා සැලකිය යුතු වේ. විශේෂයෙන්ම සෑම විෂයයක්ම ඉගැන්වීමේදී අනාගත දෘෂ්ටි කෝණයෙන් සිතීමට නිර්මාණයට සහ පරිකල්පනයට සිසුන් යොමු කිරීමෙන් ඉගෙනීම පිළිබඳ නව දිශානතියක් ඔවුන්ට ලබා දිය හැකි වේ. අතීත, වර්තමාන සහ අනාගත විඥානය ද සමෝධානිත කොට ඉගැන්වීමෙන් ඉගෙනුම් ක්‍රියාවලිය තුළ නව ප්‍රවේශයකට යොමු විය හැකිය. මෙසේ අධ්‍යාපන පටිපාටිය සකස් වීමෙන් පූර්වාදර්ශ නැති, ගැටලුවලින් යුක්ත ලෝකයක මිනිසුන්ට තමා මුහුණ දෙන නව තත්ත්වයන්ට මුහුණ දීමේ කායික මානසික ශක්තිය ගොඩනගා ගැනීමේ හැකියාව පවතී.

නව ලොවෙහි විෂමතාවන්ට ගැලපෙන, බුද්ධිමත්, පරහිතකාමී, සාරධර්ම අගයන පරිපූර්ණ මිනිසකු බිහි කිරීමේදී සැකසෙන ඕනෑම අධ්‍යාපන ප්‍රතිපත්තියක අවධානය යොමුවිය යුතු අංශ කිහිපයක් වෙයි.

- පුද්ගලයාට විවිධ අංශවලින් නව ප්‍රවණතාවන්ට මුහුණ දීමට හැකියාව ලබා දීම.
- නවීන ලෝකයට අනුකූල වන පරිදි පුද්ගලයා හැඩ ගැස්වීම.

- කරුණු වෙන් වෙන් වශයෙන් තෝරා බේරා ගැනීමට හැකියාව හෙවත් විශ්ලේෂණ හැකියාව දියුණු කරවීම.
- වෙන් වෙන්ව පවත්නා දේ සමෝදානය කර බැලීමට හැකියාව ලබා දීම.
- යම්කිසි දෙයක වටිනාකම නිශ්චය කිරීමේ හැකියාව හෙවත් ඇගයීම් ලබාදීමේ සක්‍යතාව දියුණු කිරීම.
- පූර්ව දැනුවත්වීමකින් තොරව නොසිතූ මොහොතක නොසිතූ අයුරින් පැමිණෙන කුමන අභියෝගයකට වුවද මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
- ගතානුගතික ඉගෙනීමෙන් මිදී පුද්ගලයා යාවජීව අධ්‍යාපන ක්‍රියාවලියකට යොමු කරවීම.
- නිදහස් මානසිකත්වයෙන් යුතුව පුද්ගලයාට මානව වර්ගයාට ප්‍රයෝජනවත් නව දේ නිර්මාණය කිරීමේ සක්‍යතාව වර්ධනය කිරීම.
- පුද්ගල විෂමතාවන් මධ්‍යස්ථව, උපේක්ෂා සහගතව ඉවසා සහජීවනයෙන් අන්‍යයන් සමඟ කටයුතු කිරීමට පුද්ගල නැමියාව වර්ධනය කිරීම.
- පුද්ගලයා තුළ ගැටලු විසඳා ගැනීමේ හැකියාව ඇති කිරීම.
- අන්‍යයන්ගේ දුකේදී දුක්වීමටත් සැපතේදී සතුටුවීමටත් හැකියාව ඇති සංවේදී මිනිසුන් ඇති කිරීම.
- සීමාසහිත සම්පත් ඇති ලෝකයක අසීමිතව සම්පත් පරිභෝජනයේ අර්බුධකාරීත්වය අවබෝධ කරවීම.
- පරිසරහිතකාමිත්වය පුද්ගලයා තුළ ඇති කිරීම.
- සමාජ සබඳතා ගොඩනගා ගැනීමේ හැකියාව ඇති කිරීම.

- සෞන්දර්යකාමිත්වය හෙවත් වින්දනාත්මක හැඟීම් ඇතිවන නිදහස් චින්තනයක් පුද්ගලයා තුළ ඇති කිරීම.
- අන්‍ය සංස්කෘතීන් අගය කිරීමට තරම් විවෘත මනසක් මිනිසා තුළ ඇති කිරීම.
- ප්‍රජාතාන්ත්‍රික පෞරුෂයක් මිනිසුන් තුළ ගොඩනැංවීම.
- දේශීයත්වය අගයන ජාතිකාභිමානයට ගරු කරන මිනිසුන් බිහි කිරීම.

මීට අමතරව අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් වීමේදී ප්‍රමුඛත්වය යොමුවිය යුතු අංශ කිහිපයකි. විද්‍යාවෙන් හෙවත් අධ්‍යාපනයෙන් පුද්ගල විනය ඇතිකළ හැකි විය යුතුය. බෞද්ධ දර්ශනය තුළද එය ප්‍රතීයමාන වෙයි. (විද්‍යා දදාති විනයං) එමෙන්ම පාසල් වැනි අධ්‍යාපන ආයතන තුළ විෂය කරුණු සහ පෙළ පොත්වල සැළකිය යුතු වෙනස්කම් රැසක් සිදුවිය යුතුබව පෙනෙයි. තවද ගුරුභවතුන්ගේ ගරුත්වය රැකෙන පසුබිමක් සැකසිය යුතුය. එහිදී ගුරු සේවයේ සහ විදුහල්පති සේවයේ සියලුම වැටුප් විෂමතාවන්ට පිළියම් යෙදිය යුතු අතර උසස්වීම් යනාදියෙහි විධිමත් බවක් ඇතිවිය යුතු බව පෙනෙයි.

මේ අනුව වත්මන් අධ්‍යාපනය මිනිසාගේ අතීත අවශ්‍යතා සපුරා ගැනීමට වඩා වර්තමාන සහ අනාගත අරමුණු සඵල කරගනු වස් ඒ සඳහා යොමු විය යුතුය. එමෙන්ම ලෝකයේ අනාගත වෙනස්වීම් වලට මුහුණදීමට නම් අධ්‍යාපනයේ විප්ලවීය වෙනසක් සිදුවිය යුතුය. මෙහිදී අධ්‍යාපන අරමුණු, ව්‍යූහය, විෂය මාලාවන්, ඉගැන්වීමේ ක්‍රම සහ ඇගයීම් මෙන්ම අධ්‍යාපන කාර්යයෙහිලා ගැනෙන භෞතික සහ මානව සම්පත් පරිහරණයේද නව්‍යතා ඇතිවිය යුතුය.

**සමාලෝචනය**

නූතන ලෝකයේ බොහොමයක් අධ්‍යාපන ක්‍රමවේදයෙහි ප්‍රායෝගික පක්ෂය හීනබව පෙනෙයි. සමාජය ඉතා සීඝ්‍රයෙන් දියුණු වන විට අධ්‍යාපනය ද ඊට සරිලන අයුරින් සංවර්ධනය වීම අවශ්‍යය. එහිදී පූර්ණ සංවර්ධනයක් අපේක්ෂා කෙරේ. මෙහිදී අධ්‍යාපනයේ කර්තව්‍ය විය යුත්තේ පැවති දැනුම් සම්භාරය හා කුසලතා ආදිය

පවත්වා ගෙනයාම සඳහාත් නව ලොවට උචිත අධ්‍යාපනික ක්‍රමවේදයන් ඔස්සේ මානවයාගේ බුද්ධිය සේම අධ්‍යාත්මික ගුණවගාවද අධ්‍යාපනලාභියා තුළ ඇතිකරලීමයි. මෙහිලා යාවජීව අධ්‍යාපන ක්‍රමවේදයද පුනරාවර්තන අධ්‍යාපන රටාවද විවිධ පැතිකඩ ඔස්සේ වැදගත් බව කිව හැකිය. නව ලොවට සරිලන අධ්‍යාපන අරමුණු සැකසීමේදී මිනිසාගේ බුද්ධියෙහි මෙන්ම ආධ්‍යාත්මයේ ද සංවර්ධනයක් ඇති කළ යුතු බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරළ, ඩී, නව අධ්‍යාපන රචනා, 1982, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10.

කුලරත්න ඩබ්. ජී, අධ්‍යාපන සැලසුම්කරණය, 2000, සාර ප්‍රකාශන හා මුද්‍රණ, අතුරුගිරිය පාර, කොට්ටාව.

රණසිංහ එච්, විශිෂ්ට පාසලක් සඳහා අධ්‍යාපන සැලසුම්කරණය, 2004, කතෘ ප්‍රකාශන.

හෙට්ටිආරච්චි කේ, විසිඑක්වන ශතවර්ෂය සඳහා අධ්‍යාපනය, 2000, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

රස්නැක් බී, අධ්‍යාපනය හා ජීවිතයේ අරුත, 1996, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

සිරිසේන එස්, ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු, 1999, ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික් ආයතනය, බෝධිරාජ මාවත, කොළඹ.

හෙට්ටි ආරච්චි, කේ, අධ්‍යාපන කළමණාකරණයේ නව ප්‍රවනතා, ප්‍රකාශනය- එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ-10, ප්‍රථම මුද්‍රණය-2000.

චන්ද්‍රපාල කේ, විසිඑක්වන සියවසට අධ්‍යාපනය- හෙට ලොව සඳහා බිහිකළ යුතු මිනිසා, 1995 (ප්‍ර.මු) අධ්‍යාපන ප්‍රවර්ධන සඟරාව, (සංස්:) රාජා ගුණරත්න, ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රවර්ධන සංගමයේ ප්‍රකාශනයකි.